ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகம் திணைக்களம்
LAND COMMISSIONER GENERAL's DEPARTMENT

ෆැක්ස් / தொலைநகல் / Fax 2684051

නො.07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7, கிரகறீஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue Colombo 07

ඊ-මේල් / மின்னஞ்சல் / E-mail Landcom@sltnet.lk


මගේ අංකය / எனது இல / MY NO 5 / 2 / 6 / චක්‍රලේඛ (i)

ඔබේ අංකය / உமது இல / YOUR NO

දිනය / திகதி / DATE 2007.01 19

චක්‍රලේඛ අංක :- 2007 / 1

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## <u>ඉඩම් සංවර්ධන ආඥා පනත් යටතේ</u>
## <u>නිකුත් කර ඇති ප්‍රදාන පත්‍ර පැවරීම.</u>

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති ප්‍රදාන පත්‍ර පැවරීමේදී එම පනතේ නීතිමය ප්‍රතිපාදන වලට පටහැනිව ප්‍රදාන පත්‍ර පැවරීම් පිළිබඳව ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් වාර්තා වී ඇති බැවින් ඊට සුදුසු පියවර ගන්නා ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය සරත් අමුණුගම අමාත්‍ය තුමා උපදෙස් දී ඇති බව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලේ / පොදු / 2006 හා 2006.11.20 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත.

එසේම ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉඩම් සංවර්ධන ආඥා පනතේ හෝ නියෝග වල උපදෙස් නොමැති අවස්ථා සඳහා ප්‍රදාන පත්‍ර සහිත ඉඩම් පවරා ගැනීම ගැන විරුද්ධත්වයක් නැති බවට සාමාන්‍ය ලිපි නිකුත් කිරීම නිසා තමන් අපහසුතාවයට පත්ව ඇති බව ද ප්‍රාදේශීය ලේකම් වරුන් මා වෙත වාර්තා කර ඇත.

එබැවින් ඉඩම් සංවර්ධන ආඥා පනතේ VI පරිච්ඡේදයේ 42 සිට 47 දක්වා වූ වගන්ති කෙරෙහිත් (1996 අංක 20 දරණ පනතේ සංශෝධනය ද ඇතුලුව), අංක 131, 132, හා 137 සිට 140 දක්වා වූ ඉඩම් නියෝග කෙරෙහිත් ඔබගේ අවධානය යොමු කරන අතර එම නීතිමය උපදෙස් වලට පරිබාහිර සියලු පැවරීම් හා ලිපි නිකුත් කිරීම වහාම අත්හිටුවන ලෙස මෙසින් උපදෙස් දෙමි.

දීමනාපත්‍ර පැවරීම සඳහා අවසර දීමේදී ඉඩම් නියෝග 137 සිට 140 දක්වා වූ උපදෙස් කෙරේ ඔබගේ දැඩි අවධානය යොමු කරන අතර මෙය නොසලකා හැරීම නිසා රජයේ ඉඩම් අනවසරයෙන් ඇල්ලීමේ ප්‍රවනතාවයක් ද දැකිය හැකිවේ. ප්‍රදාන පත්‍ර ඉඩම් බද්දීමට හා උගස් කිරීමට ඉඩදී තිබෙන අවස්ථා පිළිබඳව ඉඩම් සංවර්ධන ආඥා පනතේ 43 (අ) වගන්තියේ සඳහන් "ඉඩම් කොටසක හිමිකරු නියමිත විශේෂ අවස්ථා වලදී මිස ඉඩම් කොටස වෙනත් අයෙකුට බද්දට නොදිය යුතුය" යන වගන්තිය සඳහා මෙතෙක් රෙගුලාසි හා නියෝග පනවා නොමැති නිසා එවැනි අවස්ථා මොනවාද යන්න නිශ්චය කර නැත. එබැවින් එවැනි අවස්ථා සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් වරුන්ට තම අභිමතය අනුව නිර්වචනය් කරමින් බද්දීම, උගස් කිරීම හෝ පැවරීම සඳහා අවසර දිය නොහැකිය. එමෙන්ම පනතේ 43 (ආ) වගන්තිය යටතේ බදු දීමට හෝ උගස් කිරීමට අනුමත ආයතන ලැයිස්තුවේ සඳහන් "නියමිත ආයතන" යන්නද පනතේ හෝ රෙගුලාසි වලින් විස්තර කර නොමැත. එම නිසා එවැනි ආයතන ද ප්‍රාදේශීය ලේකම්ට අභිමත පරිදි නිර්වචනය කිරීම කළ නොහැකි බවද පැහැදිලි කිරීමට කැමැත්තෙමි. යම් අවසරයක් ලබාදිය හැකි අවස්ථා වලදී ඒ සඳහා භාවිතා කළ යුතු වන්නේ ඉඩම් නියෝග 139 යටතේ හඳුන්වා දී ඇති ආකෘති අංක 5 පමණි. ඉන් බැහැර වෙනත් ආකාරයට පරිපාලනමය ලියවිලි නිකුත් කිරීම නොකළ යුතු බවටද මෙසින් උපදෙස් දෙමි.

ප්‍රදානපත්‍ර බැහැර කිරීමේ දී ඒ පිලිබඳ තොරතුරු නිසි පරිදි තබා ගැනීම එම ඉඩම් සම්බන්ධව ඉදිරියේ දී පැන නැගිය හැකි ගැටළු හා නීතිමය කටයුතු සඳහා ඉතා වැදගත් වන නිසා මින් ඉදිරියට "ප්‍රදාන පත්‍ර පැවරීමේ ලේඛණයක්" ප්‍රදාන පත්‍රයට අදාළ ලෙජරයේ පසුපස පිටුවේ පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. එසේ වෙනත් සටහනක් යොදා ඇති අවස්ථාවක මෙම ලේඛණය ලෙජරයට අමුණා තබා ගැනීම සුදුසුය. ඒ සඳහා භාවිතා කළ යුතු ආකෘතියක් මේ සමග අමුණා ඇත. කරුණාකර දැනටමත් පැවරීම් කර ඇති ප්‍රදාන පත්‍ර ඇතුලුව සියලුම ප්‍රදාන පත්‍ර උගස් කිරීම හා පැවරීම පිළිබඳ විස්තර මෙම ලේඛනයට ඇතුලත් කොට එසේ පැවරීම් කරන සෑම අවස්ථාවකම අදාළ පැවරීමේ ලේඛණයේ ප්‍රාදේශිය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාදීම අවශ්‍යය. මේ සම්බන්ධව ගැටලුවක් ඇත්නම් නොපමාව මා අමතන්නේ නම් මැනවි.

එස්. ඩී. ඒ. බී. බොරලැස්ස
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:- 01. ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා - දැ.ගැ.පි.
02. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.පි.
03. ලේකම්, කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය - දැ.ගැ.පි.
04. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් - දැ.ගැ.පි.
05. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ.ගැ.පි.

[illegible]

**දීමනා පත්‍ර පැවරීමේ ලේඛණය**

දීමනාකරුගේ නම :- ..........

දීමනා පත්‍ර අංකය :- ..........

ලිපිනය :- ..........

| අනු අංකය | පැවරූ දිනය | පැවරූ අයගේ නම ලිපිනය | ප්‍රා.ලේ / ස.ප්‍රා.ලේ අනුමැතිය | අනු අංකය | පැවරූ දිනය | පැවරූ අයගේ නම ලිපිනය | ප්‍රා.ලේ / ස.ප්‍රා.ලේ අනුමැතිය | අනු අංකය | පැවරූ දිනය | පැවරූ අයගේ නම ලිපිනය | ප්‍රා.ලේ / ස.ප්‍රා.ලේ අනුමැතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |